**මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு**
**Public Service Commission of Central Provincial Council**

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*
e-mail: psc.cp.gov@.gmail.com

කාර්යාලය / காரியாலயம் / Office - 081-2213097
ලේකම් / செயலாளர் / Secretary - 081-2213096
සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary - 081-5631321
ෆැක්ස් / பெக்ஸ் / Fax - 081-2213082, 081-2213096

මගේ අංකය / எனது இல. / My No. CPC/PSC/09/කා.නි./02
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2020.09. 18

මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**<u>කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම</u>**
**<u>මධ්‍යම පළාත් තාක්ෂණ සේවය</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2020.01.27 දිනැති ලිපිය මගින් දැනුම් දෙන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුකූලව සකස් කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2016 (IV) හා බැඳේ.

02. එම චක්‍රලේඛයේ ඔබ වෙත ඉදිරිපත් කරන ලද පිටපතෙහි ඡේද අංක 03හි සඳහන් වගුවේ මුද්‍රණ දෝෂයක් පවතින බැවින්, එම මුද්‍රණ දෝෂය නිවැරදි කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2016 (IV) හි පිටපතක් මේ සමඟ ඉදිරිපත් කරන බව කාරුණිකව දැනුම් දෙමි.

03. මේ සම්බන්ධව මෙම කොමිෂන් සභා වෙබ් අඩවිය මගින්ද දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර උක්ත කරුණ සම්බන්ධව ඔබ ආයතනය යටතේ සේවයේ නිරත මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ටී.ඒ.ඩී.ඩබ්.දයානන්ද,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

පිටපත්

1. ආණ්ඩුකාර ලේකම්, මධ්‍යම පළාත. - දැ.ගැ.පි.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ - 02/2016(IV)

මාගේ අංකය : CPC/PSC/09/TO/02
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා
කොමිෂන් සභා කාර්යාලය,
අංක : 244, කටුගස්තොට පාර,
මහනුවර,
2020 ජනවාරි මස 22 වැනි දින

මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන්,

**කාර්යක්‍ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීම.**
**මධ්‍යම පළාත් තාක්‍ෂණ සේවය.**

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය මත මා විසින් 2016.10.14 දින නිකුත් කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2016 හි විධිවිධාන පරිදි නියමිත සේවා ව්‍යවස්ථාව හෝ පරිපාටියේ සඳහන් විධිවිධානවලට අනුකූලව පැවැත්වීමට නියමිතව තිබූ කාර්යක්‍ෂමතා කඩඉම් විභාග අවස්ථා සංඛ්‍යාවට අනුගාමී විභාග සංඛ්‍යාවක් මගින් මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන්ට කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණ සම්පූර්ණ කළ හැකිය.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006ට අනුකූලව සකස් කරනු ලැබූ 2016.04.04 දින ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලද 2013.06.01 දින සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් තාක්‍ෂණ සේවා ව්‍යවස්ථාවේ උපඡේද අංක 08.2 හි සඳහන් ලෙස තාක්‍ෂණ සේවයේ නිලධාරීන් හට කාර්යක්‍ෂමතා කඩඉම් විභාග වර්ෂයකට **දෙවරක් බැගින්** පැවැත්විය යුතු වේ. එබැවින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ක්‍රියාත්මක වන 2006.01.01 දින සිට 2013.06.01 දින දක්වා පළමු හා දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් එළඹෙන මධ්‍යම පළාත් තාක්‍ෂණ සේවයට අයත් තනතුරු දරන නිලධරයන් හට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ - 02/2016 හි විධිවිධාන පරිදි 1 වන සහ 2 වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය සමත්වීම සඳහා අනුගාමී විභාග අවස්ථා හයක (06) සහන කාලයක් හිමි වේ.

03. ඔබගේ පහසු අවධානය සඳහා මධ්‍යම පළාත් තාක්‍ෂණ සේවයේ III ශ්‍රේණියට හා II ශ්‍රේණියට අදාළව 2006.01.01 දින සිට 2013.06.01 දින දක්වා කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණ පැවැත්වූ දිනයන් පහත වගුවේ දැක්වේ.

| III ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්‍ෂණය පැවැත් වූ දිනය | II ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්‍ෂණය පැවැත් වූ දිනය |
|---|---|
| 2007.04.21 | 2007.04.21 |
| 2009.12.05 | 2009.12.05 |
| 2011.03.27 | 2011.03.27 |
| 2013.03.30 | 2013.03.30 |
| 2014.02.15 | 2014.02.15 |
| 2015.01.24 | 2015.01.24 |
| 2016.01.30 | 2016.01.30 |
| 2016.12.11 ( 2016 – I ) | 2016.12.11 ( 2016 – I ) |
| 2017.12.09 ( 2016 - II) | 2017.12.09 ( 2016 - II) |
| 2018.09.22 ( 2017 – I ) | 2018.09.22 ( 2017 – I ) |
| 2019.10.19 ( 2017 – II ) | 2019.10.19 ( 2017 – II ) |

04. ඒ අනුව, ඉහත වගුවේ දක්වා ඇති 2006.01.01 දින සිට 2013.06.01 දින දක්වා මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ පළමු කාර්යක්ෂමතා කඩඉම යෙදෙන නිලධරයින් සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම යෙදෙන නිලධරයන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 15:5:1 වගන්තිය පරිදි ඉදිරි කටයුතු කරන ලෙස මෙයින් කාරුණිකව දන්වමි.

05. මෙය අතීතයට ද බලපාන පරිදි සිදුකරනු ලබන සහන සැලසීමක් වන හෙයින් පහත සඳහන් කරුණු / අතීතයේදී අහිමි වූ අවස්ථා පිළිබඳ කිසියම් පිළියමක් වර්තමානයේදී යෙදිය නොහැකි හෙයින් ද එවැනි කරුණුවලදී ගත් අතීත ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි කටයුතු කළ යුතු හෙයින් ද ඒ පිළිබඳව කරනු ලබන අභියාචනා සලකා බැලීමට අවකාශ නොමැති බව අවධාරණය කරමි.

I. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමි වූ වෙනත් සේවාවන්ට පිවිසීමේ හෝ උසස්වීම් සඳහා වූ හෝ තරග විභාගයන්ට/ සම්මුඛ පරීක්ෂණයන්ට හෝ එවැනි කිසියම් තෝරාගැනීමක් වෙනුවෙන් වූ අවස්ථාවක් සඳහා පෙනී සිටීමේ අවස්ථාවක් අහිමිවීම පිළිබඳව සහන ඉල්ලා කරනු ලබන අභියාචනා.

II. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමි වූ තනතුරු ලැබීමේ අවස්ථාවන් පිළිබඳ සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා.

III. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනයවීම් හඳුනා නොගෙන/ නොසලකමින් සාවද්‍ය ලෙසින් උසස්වීම් හෝ වෙනයම් තරග විභාගයන්ට අයැදුම්කර ඉන් සමත්ව සම්මුඛ පරීක්ෂණයේදී හෝ වෙනයම් පසු අවස්ථාවක දී වැටුප් වර්ධක විලම්භනය හඳුනා ගැනීම හෝ සැලකීම හේතුවෙන් අදාළ උසස්වීම් විභාගයේ ප්‍රතිඵල මත කෙරෙන පත්වීම් හෝ වරප්‍රසාද ලබාගැනීමට ඉදිරිපත් කෙරෙන අභියාචනා.

06. තවද, ඉහත 04 වන ඡේදයේ සඳහන් නිලධරයන් හට අදාළ සහනයන් මෙම චක්‍රලේඛය මඟින් ලබාදී ඇති බැවින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2016 විධිවිධාන පරිදි නැවත ඉල්ලීම් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බව වැඩිදුරටත් දන්වමි.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ජී.ඒ.තිලකරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.